www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථා වෙනස්කම් ආඥාදායක පාලනයක් තහවුරු කරයි

## Sri Lankan constitutional changes entrench autocratic rule

2010 සැප්තැම්බර් 21

මේ මස මුල දී ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව හරහා තල්ලු කරගත් ව්‍යවස්ථා වෙනස්කම් ගෝලීය මූල්‍ය ප්‍රාග්ධනය විසින් ඉල්ලා සිටිනු ලබන කප්පාදු න්‍යාය පත්‍රය පැටවීමේ දී ක්‍රියාවට දමනු ලබන විධික්‍රම පිලිබඳව දිවයිනේ ද ජාත්‍යන්තරව ද කම්කරුවන් වෙත කෙරෙන අනතුරු ඇඟවීමකි.

සැප්තැම්බර් 8 දා සම්මත කරගත් 18 වන සංශෝධනය ජනාධිපති මහින්ද රාජපක්ෂ විසින් ප්‍රධානත්වය දරනු ලබන පූර්න පරිමාන පොලිස් රාජ්‍යයක් කරා යන ගමනේ තවත් එක් පියවරකි. දැනටමත් ඔහුට තිබෙන පුලුල් විධායක බලතලවලට අමතරව, ජනාධිපතිට දැන් මූලික රාජ්‍ය නිලධාරීන් පත්කිරීමේ පූර්න අයිතිය හිමි වන අතර ජනාධිපති තනතුර සඳහා ඕනෑම වාර ගනනක් තරඟ කල ද හැකි ය.

රාජපක්ෂ මේ වනවිට 2005 වසරේ පසුභාගයේ පටන් විධායක ජනාධිපති ලෙස රට පාලනය කර ඇත. බලයට පත් වී මාස හතක් ඇතුලත, ජාත්‍යන්තර මැදිහත්වීමෙන් අටවන ලද 2002 සටන් විරාමය තථ්‍ය ලෙස ඉරා දමමින් ඔහු බෙදුම්වාදී දෙමල ඊලාම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහි යුද්ධය යලි දියත් කලේ ය. එක්සත් ජනපදය, ඉන්දියාව සහ අනෙකුත් මහ බලවතුන්ගේ පිටුබලය ලබමින්, ඔහු 2009 මැයි මාසයේ දී යුද්ධය ලේ වැකි අවසානයකට ගෙන ආවේ සිවිල් වැසියන් දස දහස් ගනනකගේ ජීවිතවල වියදමෙනි.

මූලික ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම්වලට එල්ල කරන අතිශය බලගතු ප්‍රහාරයක් රාජපක්ෂගේ යුද්ධය සමග අතිනත ගත්තේ ය. ව්‍යවස්ථාවෙන් හිමි වී ඇති බලතල මුලුමනින් ම යොදා ගනිමින්, ඔහු මිලිටරියේ ප්‍රධාන අනදෙන නිලධාරී වන අතරම, ආරක්ෂක හා මුදල් යන මූලික ඇමති ධූර ද සිය සන්තකයේ තබා ගත්තේ ය. ඔහු ඥාතීන්, ජෙනරාල්වරුන්, හිතමිත්‍රයන් සහ තෝරාගත් රාජ්‍ය නිලධාරීන් ආදීන්ගෙන් සමන්විත කට්ටුවක් මගින් පාලනය ගෙන යන තතු තුල, පාර්ලිමේන්තුව සහ කැබිනට් මන්ඩලය වඩ වඩා පසෙකට තල්ලු කෙරුනි. තවමත් ක්‍රියාත්මක වන හදිසි නීති තත්වය යටතේ ඔහුගේ තන්ත්‍රය ප්‍රධාන වසයෙන් දෙමල ජාතිකයින් ඇතුලුව දහස් ගනනක් නඩු නොමැතිව අත්අඩංගුවේ තබා ගත්තේ ය. තවත් සිය ගනනක් එක්කෝ ''අතුරුදහන්'' වූ අතර නැතහොත් ආරක්ෂක හමුදා සමග සන්ධාන ගතව ක්‍රියාත්මක වන ආන්ඩු හිතවාදී ඝාතක කල්ලි විසින් මරා දමන ලදී.

ඉහල තනතුරුවලට කෙරෙන පත්කිරීම් අධීක්ෂනය කිරීමට ද පොලීසිය, රාජ්‍ය සේවය, මැතිවරන, අධිකරන සේවය හා දූෂන විමර්ශන අධීක්ෂනය කිරීම සඳහා ස්වාධීන කොමිෂන් සභා ස්ථාපනය කිරීමට ද ව්‍යවස්ථා සභාවක් පිහිටුවීමට බලතල ලබාදුන් 17 වන සංශෝධනය 18 වන සංශෝධනය මගින් අවලංගු කෙරෙයි. රාජපක්ෂ යටතේ 17 වන සංශෝධනය මල'කුරක් විය. ශ්‍රේෂ්ඨාධිකරනය ව්‍යවස්ථා සභාව පිහිටුවන ලෙස ඔහුට නියෝග කලවිට ඔහු එය නො තකා හැරී ය. දැන් ව්‍යවස්ථා සභාව වෙනුවට පාර්ලිමේන්තු සභාවක් යෝජනා කෙරී ඇතත් එයට කලහැක්කේ ඉහල තනතුරුවලට පත් කිරීම් සම්බන්ධයෙන් ජනාධිපතිට උපදෙස් දීම පමනකි. එයට එම පත්කිරීම් අවලංගු කල නොහැකිය.

එක් පුද්ගලයෙකුට ජනාධිපති තනතුර වසර හයේ වාර දෙකකට වඩා දැරිය නො හැකිය යන සීමාව නව ව්‍යවස්ථා වෙනස්කම් මගින් ඉවත් කර තිබේ. 1978 ව්‍යවස්ථාවට වාර දෙකේ සීමාව පනවන ලද්දේ ඇමතිවරු ඉවත් කිරීමේ, විධායක බලතල ක්‍රියාවේ යෙදවීමේ සහ ආඥාවන් මගින් පාලනය කිරීමේ පුලුල් බලතල සහිත විධායක ජනාධිපති තනතුරක් ඇති කිරීමට එරෙහිව පුලුල්ව පැතිර තිබූ මහජන විරුද්ධත්වය නිසා ය. එවැනි බලගතු තනතුරක් දැනට දරන්නා වීමේ වාසිය සහිත රාජපක්ෂට දැන් ජීවිත කාලය පුරා ජනාධිපති තනතුර දැරීමේ දොර විවර වී තිබේ.

සංශෝධනය හදිසි පනතක් ලෙස ගුනාංගීකරනය කරමින්, එනයින් ඒ පිලිබඳව මහජන සාකච්ඡාවක් ඇති වීම වලක්වමින් සහ පාර්ලිමේන්තු ක්‍රියාදාමය පිලිබඳ සියලු විධි විධාන උල්ලංඝනය කල පැය

කිහිපයක විකාර සහගත විවාදයකට පමනක් ඉඩ තබමින්, රාජපක්ෂ පාර්ලිමේන්තුව හරහා එය තල්ලු කරගත්තේය. ව්‍යවස්ථාවට කරනු ලබන ප්‍රධාන වෙනස්කම් ජනමත විචාරනයක් මගින් අනුමත වීම අවශ්‍ය වුවත් මෙහි දී එය අනවශ්‍ය බව ශ්‍රේෂ්ඨාධිකරනය තීන්දු කලේ ය.

ව්‍යවස්ථා වෙනස්කම් හදිසියේ තල්ලු කරගැනීමට ආන්ඩුවට තිබූ හැකියාව රඳ පැවැත්තේ පාර්ලිමේන්තු විපක්ෂයේ බෙලහීන ස්වභාවය මත ය. එල්ටීටීඊයේ පරාජය ගසාකමින් රාජපක්ෂ ජනවාරියේ ජනාධිපති ලෙස දෙවන වරටත් ජයග්‍රහනය කලේ ද අප්‍රේල් මාසයේ පාර්ලිමේන්තු මැතිවරනයේ දී විශාල බහුතරයක් දිනා ගත්තේ ද බොහෝ ඡන්ද දායකයෝ විරුද්ධ පක්ෂ විකල්පයක් ලෙස දැක නො ගත් නිසා ය. විපාර්ශ්වික එක්සත් ජාතික පක්ෂය (එජාප) සහ ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) යන පක්ෂ දෙක ම රාජපක්ෂගේ වර්ගවාදී යුද්ධයට, ඔහුගේ ප්‍රජාතන්ත්‍ර විරෝධී විධික්‍රමවලට සහ ඔහුගේ වෙලඳපොල හිතවාදී ආර්ථික න්‍යාය පත්‍රයට සහයෝගය දුන්හ.

ව්‍යවස්ථාව වෙනස් කිරීම සඳහා අවශ්‍ය කරන තුනෙන් දෙකේ පාර්ලිමේන්තු බහුතරයට යන්තම් ආසන කිහිපයක් අඩුවෙන් සිටි, රාජපක්ෂ, ආන්ඩුවේ තනතුරු සහ අනෙකුත් වරප්‍රසාද පිලිබඳ පොරොන්දු මගින් එජාපයෙන් හා කුඩා පක්ෂ ගනනාවකින් අවශ්‍ය මන්ත්‍රීවරු ප්‍රමානය ආන්ඩුව පැත්තට බාගැනීමට සමත් විය. 1978 ව්‍යවස්ථාව සම්බන්ධයෙන් වගකිව යුතු සහ ප්‍රජාතන්ත්‍ර විරෝධී විධික්‍රම පිලිබඳව කුප්‍රකට එජාපය පාර්ලිමේන්තුවේ ඡන්ද විමසීම වර්ජනය කලේ ය. 2005 ජනාධිපතිවරනයේ දී රාජපක්ෂට සහයෝගය දුන් ජවිපෙ බෙලහීන වීදි විරෝධතාවක් පැවැත්වීය. පනතට එරෙහිව භාවිතා වූයේ ඡන්ද 17ක් පමනි.

ඡන්ද විමසීම හුදෙක් වැඩකරන ජනතාව ද සමස්ත කොලඹ දේශපාලන සංස්ථාපිතය ද අතර පවත්නා ගැඹුරු විභේදනය ඉස්මතු කර දැක්වීය. ජනවාරියේ ජනාධිපතිවරනයේ දී සියයට 40ක විශාල ප්‍රමානයක් ඡන්දය දීමෙන් වැලකුනි. ඩේලි මිරර් පත්‍රය පවා සිය කතුවැකියේ මෙසේ සඳහන් කලේ යඃ ''පනතට (18 වන සංශෝධනයට) පක්ෂව තුනෙන් දෙකකට වැඩි පාර්ලිමේන්තු බහුතරයක් ඔහු (රාජපක්ෂ) රැලි කරගත් බව සැබෑ ය. එහෙත් රටේ පුරවැසියන් බොහොමයක් දෙනා සිතන්නේ මෙම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් අතිමහත් බහුතරය වැරදි බව යි.''

සංශෝධනයේ අරමුන පිලිබඳව රාජපක්ෂ සහ ඔහුගේ සහායකයෝ පැහැදිලිවම විවෘතව කතා කරති. එනම් ජාතිය ගොඩනැගීම හා ශ්‍රී ලංකාව ''දකුනු ආසියාවේ ආශ්චර්යය'' බවට පත්කිරීම පිනිස ''ආර්ථික යුද්ධයක්'' ගෙන යාම සඳහා ''ස්ථාවර ආන්ඩුවක්'' තහවුරු කිරීම පිනිස ය. ලී ක්වාන්යූගේ 30 වසරක පාලනය සහ සිංගප්පූරුවේ ඔහුගේ ආඥාදායක තන්ත්‍රය සමග සංසන්දනයන් කරන ලදී .

කෙසේවෙතත් 2010 ශ්‍රී ලංකාව 1960 ගනන් සහ 1970 ගනන්වල සිංගප්පූරුව නො වේ. යුද්ධයේ නය බරින් මිරිකී සිටින සහ ගෝලීය මූල්‍ය අර්බුදයෙන් දැඩි ප්‍රහාරයට ලක්වී සිටින ශ්‍රී ලංකාවේ තන්ත්‍රය ලොව පුරා අනෙකුත් ආන්ඩු මෙන් උග්‍ර කප්පාදු පියවර පැටවීමේ පීඩනයට මුහුන දී සිටී. ජීවන කොන්දේසි පිරිහීමට එරෙහිව වැඩකරන ජනයා අතර අනිවාර්යයෙන් ම පුපුරා යාමට නියමිත විරුද්ධත්වයට සූදානම් වීම සඳහා රාජපක්ෂ සිය බල ග්‍රහනය ශක්තිමත් කරගනිමින් සිටී.

''ස්ථාවර'' සහ ''ශක්තිමත්'' ආන්ඩු සඳහා වන ඉල්ලීම් ශ්‍රී ලංකාවට පමනක් සීමා වී නැත. ආන්ඩුවල පිලිවෙත් මගින් නිෂ්පාදිත සමාජ අර්බුදයට එරෙහිව වැඩෙන මහජන අතෘප්තියට සහ විරුද්ධත්වයට ආන්ඩු මුහුන දෙන තතු තුල දේශපාලන අස්ථාවරභාවය නීතිය බවට පත්වෙමින් තිබේ. ඕස්ට්‍රේලියාවේ මාස හතරක දේශපාලන කලබගෑනි, වසර 70කින් මෙපිට පැවති බහුතරයකින් තොර ප්‍රථම පාර්ලිමේන්තුව පැන නැංවීමට තුඩු දුනි. ඉන් පසුව හරිතයන්ගේ සහයෝගය සහිත ලේබර් ආන්ඩුවක් පිහිටුවීම සඳහා දරන ලද උපාමාරු තුල දී, මහ ව්‍යාපාරික මාධ්‍යවල උත්සුකතාව සැලකූ කල, ප්‍රමුඛ කාරනය වූයේ තවදුරටත් වෙලඳපොල හිතවාදී ''ප්‍රතිසංස්කරන'' ක්‍රියාවට දැමීම සඳහා ''දේශපාලන ස්ථාවරත්වයේ'' අවශ්‍යතාව යි.

ඒ හා සමානව මැයි මාසයේ පැවති මහ මැතිවරනයේ දී බ්‍රිතාන්‍යයේ බහුතරයකින් තොර පාර්ලිමේන්තුවක් තේරී පත්විය. ලේබර් පක්ෂ නායකත්වයෙන් සහ අගමැති ධූරයෙන් ඉවත් වෙමින් ගෝඩන් බ්‍රවුන් මෙසේ ප්‍රකාශ කලේ යඃ ''අප සියලු දෙනා මතකයේ තබා ගතයුතු කාරනය වන්නේ අප ඉදිරියේ පවතින අභියෝගයන්ට මුහුන දියහැකි අධිකාරය සහිත වූත් පාර්ලිමේන්තුව තුල සහයෝගය දිනාගත හැකි වූත් ශක්තිමත් ස්ථාවර ආන්ඩුවක අත්‍යවශ්‍ය භාවය යි.'' දැන් බ්‍රිතාන්‍යයේ කොන්සර්වැටිව්-ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී සහාග ආන්ඩුව, තැචර් පාලනය යටතේ ක්‍රියාවට දමන ලද අපකීර්තිමත් වියදම් කප්පාදු පරයා යන කප්පාදු වැඩපිලිවෙලක් ක්‍රියාත්මක කරයි.

සමාජ ආතතීන් තියුනු වෙද්දී පාර්ලිමේන්තු විධික්‍රම හරහා ගැඹුරු ලෙස මහජන අප්‍රසාදයට ලක්වන පිලිවෙත් ක්‍රියාවට දැමීම පාලක පන්තියට වඩ වඩා අපහසු වනු ඇති අතර එම තතු තුල ආඥාදායක සහ

පාර්ලිමේන්තුවට පරිබාහිර පාලන ක්‍රමවලට හැරෙනු ඇත. අර්ථභාරී ලෙස බර්ලින්හි හම්බෝල්ට් විශ්ව විද්‍යාලයේ මහාචාර්ය හර්ෆ්‍රයිඩ් මුන්ක්ලර් මේ වසරේ මුල් භාගයේ ''ප්‍රජාතන්ත්‍රවාදය හෙම්බත් වීම'' සහ ආඥාදායක පාලන ක්‍රමවල ධනාත්මක අංශ පිලිබඳ දීර්ඝ රචනාවක් ඉදිරිපත් කරමින් ''ආඥාදායකත්වය'' පිලිබඳ කාරනය ජර්මනිය තුල ප්‍රසිද්ධ සාකච්ඡාවකට ගෙන ආවේ ය.

1930 ගනන්වලින් මෙපිට නරක ම ගෝලීය ආර්ථික අර්බුදය අනවරතව දිග හැරෙද්දී කම්කරු පන්තියට ජාත්‍යන්තරව මුහුන දීමට සිදුවන්නේ කුමකටදැයි යන්නට ශ්‍රී ලංකාවේ ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදයේ වැඩි දියුනු වූ කුනු වීම පෙර නිමිත්තකි. පසුගාමී මෙන් ම දියුනු ධනේශ්වර රටවල ද එක ම දේශපාලන විකල්පය වන්නේ සමාජවාදී වැඩපිලිවෙලක පදනම මත කම්කරු පන්තිය ස්වාධීන බලයක් ලෙස ඉස්මතු වීම යි. ප්‍රජාතන්ත්‍ර අයිතීන් ආරක්ෂා කරගැනීම වැඩකරන ජනයාගේ අවශ්‍යතාවලට එරෙහිව ධනවත් අතලොස්සකගේ අවශ්‍යතා ආරක්ෂා කරන ලාභ ගරන පද්ධතිය අහෝසි කිරීමේ අරගලය සමග බැඳී තිබේ.

විජේ ඩයස්